10 ශ්‍රේණිය

10 පාඩම

බුද්ධ ධර්මය

# රුදුරු මිනිසුන් අතර වෙමු අපි සොඳුරු මිනිසුන්




අධ්‍යාපන අමාත්‍යාංශය - ජාතික අධ්‍යාපන ආයතනය

# රුදුරු මිනිසුන් අතර වෙමු අපි සොඳුරු මිනිසුන්

- නෙළුම් අලය පැල වී නෙළුම් ගස වැඩෙන්නේ මඩ සහිත අපිරිසිදු ජලයෙහි ය.

- මඩෙහි හට ගන්නා නෙළුම පිරිසිදු ය. නොපැහැපත් මඩ දියෙහි පැහැපත් නෙළුම විකසිත වේ.

- මඩෙහි හට ගෙන එයින් ම පෝෂණය ලැබූව ද එහි නොගෑවී ඉන් උඩට මතුවී සුසිනිඳු ව සුවඳවත් ව ප්‍රසන්න ව නෙළුම් මල විකසිත වේ.



# රුදුරු මිනිසුන් අතර වෙමු අපි සොඳුරු මිනිසුන්

- අපිරිසිදු මඩ ගොහොරුව ඇසුරු කර ගත් ජලකඳක් මෙන් රාගාදී කෙලෙස් මල නිසා දූෂිත ව සිටින මිනිසුන් සහිත වූ මේ ලෝකයෙහි බුදුරජාණන් වහන්සේ වැඩ සිටියහ.

- එහෙත් ඒ කෙලෙස් මඩ වගුරෙහි නොගිලුණහ. රාගාදී සියලු කෙලෙස් මලින් තොර ව බුදුරජාණන් වහන්සේ බැබළුණේ මඩ සහිත ජලයේ නොතැවරී ඉහළට මතු වූ නෙළුම් මලක් සේ ය. මෙසේ වැඩ සිටීම පද්මාකාර ජීවිතයක් ගත කිරීමකි.



# රුදුරු මිනිසුන් අතර වෙමු අපි සොඳුරු මිනිසුන්


- ද්‍රෝණ යනු මිනිසුන්ගේ අංග ලක්ෂණ බලා ඔවුන් හඳුනා ගත හැකි ශාස්ත්‍රයක් දැන සිටි බමුණෙකි. ඔහු බුදු රජාණන් වහන්සේ ගෙන්,

ඔබ දෙවියෙක් ද, ගාන්ධර්වයෙක් ද, යක්ෂයෙක් ද, මනුෂ්‍යයෙක්දැයි පිළිවෙළින් විමසා සිටි

- නමුත් උන් වහන්සේ වදාළේ තමා ඒ කිසිවෙකු නොවන බව ය. බුද්ධ නම් වන බව ය

# රුදුරු මිනිසුන් අතර වෙමු අපි සොඳුරු මිනිසුන්

- දෙවියෝ ද, ගාන්ධර්වයෝ ද, යක්ෂයෝ ද, මනුෂයෝ ද රාගාදී කෙලෙස් සහිත සිත් ඇත්තෝ ය.
- එහෙත් බුදුරජාණන් වහන්සේ රාගාදී කෙලෙස් මලින් තොර වූ පිරිසිදු සිත් ඇති උතුමකු වන සේක.




# රුදුරු මිනිසුන් අතර වෙමු අපි සොඳුරු මිනිසුන්


- විලෙහි හට ගන්නා නෙළුම් වුව ද විවිධාකාර ය.
- සමහර නෙළුම් මඩෙහි ම හට ගෙන මඩෙහි ම වැතිරී මඩ දිය සමග එක් ව පොකුණු පතුලෙහි ම රැඳී සිටී
- සමහර නෙළුම් මඩ ජලය සමග සම ව සිටී.
- මඩ සහිත පොකුණු පත්ලෙන් ඉහළට නැගුණු මඩ දිය ඉක්මවා යාමට එම නෙළුම් අසමත් ව ඇත.

# රුදුරු මිනිසුන් අතර වෙමු අපි සොඳුරු මිනිසුන්

එහි සමහර නෙළුම් මල් මෙන් සමහර මිනිස්සු කෙලෙස් මඩ වගුරෙහි ම ඇලී ගැලී සිටිති. එයින් ගැලවී ඉස්මතු වීමට අසමත් වෙති. තවත් සමහරු මඩ දිය හා සම ව සිටින නෙළුම් මෙන් කෙලෙස් හා සම ව සිටී. එයින් ඉහළට ඒ කෙලෙස් මල ඉක්මවා යාමට අසමත් වෙති.







# රුදුරු මිනිසුන් අතර වෙමු අපි සොඳුරු මිනිසුන්

මඩ වතුරෙන් ඉහළට මතුවී එහි නොගෑවී සිටින නෙළුම් මල් මෙන් බුද්ධාදී උතුමෝ කෙලෙස් මඩ වතුරෙන් ඉහළට නැගී එහි නොගෑවී වැඩ වසති. එම ජීවිතය හැඳින්වෙන්නේ පද්මාකාර ජීවිතය යනුවෙනි.



# රුදුරු මිනිසුන් අතර වෙමු අපි සොඳුරු මිනිසුන්

- සමාජයේ සමහරු ඉතා නොදියුණු අවම පෞරුෂ ඇත්තෝ ය. ඔවුන් මඩෙහි ම ගැලී සිටින නෙළුම් පොහොට්ටු වැනි ය.
- තවත් සමහරු මධ්‍යම වර්ධනය සහිත පෞරුෂ ඇත්තෝ ය. ඔවුන් මඩ ජලය හා සම ව සිටින නෙළුම් පොහොට්ටු වැනි ය.
- බුද්ධාදී උතුමෝ උත්තම පෞරුෂ ඇත්තෝ ය. උන් වහන්සේලා ගත කරන්නේ පද්මාකාර ජීවිතයකි.

# රුදුරු මිනිසුන් අතර වෙමු අපි සොඳුරු මිනිසුන්

ලෝකය **අනුසෝතගාමී** ය. ගඟ පහළට ම ඇදීයන්නේ ය. මිනිස්සු රාගයෙන් රාගයට ම යති. ද්වේශයෙන් ද්වේශයට ම යති. මෝහයෙන් මෝහයට ම යති. කාමයෙන් කාමයට ම යති. වෛරයෙන් වෛරයට ම යති.

බුදු දහම **පටිසෝතගාමී** ය. එනම් අප යටිගම් බලා යාම හැරපියා උඩුගම් බලා යාමට පොළඹවන්නේ ය.




# රුදුරු මිනිසුන් අතර වෙමු අපි සොඳුරු මිනිසුන්

## පද්මාකාර ජීවිතයෙන් අපට ගතහැකි ආදර්ශ

- දූෂිත සමාජයේ අදූෂිත තැනැත්තෙක් විය යුතුය.
- දුසිරිත් කරන මිනිසුන් සහිත සමාජයේ සුසිරිත් වඩන තැනැත්තෙකුවේ.
- අකුසල් කරන මිනිසුන් අතර කුසල් කරන්නකු වෙයි.
- පව්කම් කරන්නවුන් අතර පිංකම් කරන්නකු වෙයි.

සමාජ විරෝධී, විනය විරෝධී හා නීති විරෝධී කිසිවෙක නොගැටී නොඇලී ඒ සියල්ල ම ඉක්මවා ගිය පෞරුෂයක් ගොඩනගා ගැනීමට අප සමත් විය යුතු යි. එය පද්මාකාර ජීවිතය අනුගමනය කිරීමකි.

# රුදුරු මිනිසුන් අතර වෙමු අපි සොඳුරු මිනිසුන්



**සුසුඛං වත ජීවාම**
**වේරිනේසු අවේරිනෝ**
**වේරිනේසු මනුස්සේසු**
**විහරාම අවේරිනෝ**

(ධම්ම පදය - සුඛ වග්ගය)

**අපි වෛර කරන්නවුන් අතර**
**අවෛරී ව සුවසේ වාසය කරමු.**